ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය
தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார விவகாரங்கள் அமைச்சு
**Ministry of National Policies and Economic Affairs**

"මිලෝදා" (පැරණි ටයිම්ස් ගොඩනැගිල්ල), පළමු මහල, බ්‍රිස්ටල් වීදිය, කොළඹ 01. "மிலோதா" (பழைய டைம்ஸ் கட்டிடம்), 1ஆம் மாடி, பிரிஸ்டல் வீதி, கொழும்பு 01. "Miloda" (Old Times Building), 1st Floor, Bristol Street, Colombo 01.

මගේ අංකය / எனது இலக்கம் / My No.: MPPEA/PLN/DCB/2016 ඔබේ අංකය / உமது இலக்கம் / Your No.: දිනය / திகதி / Date: 2016.01.12

චක්‍රලේඛ අංක MNPEA 01/2015 (i)

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත

<u>විමධ්‍යගත අයවැය වැඩසටහන - 2016</u>

උක්ත කරුණට අදාලව ඔබ වෙත යොමුකරන ලද 2015.11.26 දිනැති අංක MNPEA/01/2015 දරණ චක්‍රලේඛය කෙරෙහි ඔබගේ කාරුණික අවධානය යොමු කරමි. මීට ඉහත දි දැනුම් දුන් පරිදි, විමධ්‍යගත අයවැය වැඩසටහන අධීක්ෂණය කිරීමට පත්කල කමිටුවේ සභාපති, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය ගරු සාගල රත්නායක මැතිතුමා සමඟ පැවැත් වූ සාකච්ඡාවට අනුව හා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් සහ ගරු මන්ත්‍රීවරුන් හට සහය වීමට පත් කල සහකාර අධ්‍යක්ෂවරුන් සමඟ දෙසැම්බර් 18 වැනි දින මා විසින් පැවැත් වූ රැස්වීමේ දී තීරණය වූ කරුණු අනුව පහත දැක්වෙන කරුණු, පැහැදිලි කිරීම් සහ වෙනස්කම් ඔබගේ අවධානයට පහතින් දක්වමි.

1. පහත දැක්වෙන ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශවල විෂය පථය අයත්වන දිස්ත්‍රික්කවල විමධ්‍යගත ප්‍රතිපාදන අදාල ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය හරහා ඔබ වෙත නිදහස් කෙරේ.

   a) මහනගර හා බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය (කොළඹ, ගම්පහ සහ කළුතර)
   b) නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය (ගාල්ල, මාතර, හම්බන්තොට සහ මොණරාගල)
   c) අභ්‍යන්තර කටයුතු වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය (කුරුණෑගල, පුත්තලම සහ කෑගල්ල)
   d) පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය (යාපනය, කිලිනොච්චිය, මන්නාරම, මුලතිව් සහ වව්නියා)

   විමධ්‍යගත ප්‍රතිපාදනවලට අදාලව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලද වැඩසටහන අනුමැතිය සහ අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ඔබගේ දිස්ත්‍රික්කයට අදාල ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කරන මෙන් ඉල්ලමි. කරුණාකර එහි පිටපතක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත දැනුවත් වීම සඳහා ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලා සිටිමි.

දුරකථන / தொலைபேசி / Telephones: 011-3010214
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2339732, 011-2473643
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / E-mail: info@mppea.gov.lk
Website: www.mppea.gov.lk

2. ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශ යටතට නොගැනෙන අනෙකුත් සියළුම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්ව

3. රුන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව විසින් අනුමත කරන ලද විමධ්‍යගත අයවැය වැඩසටහන ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශයට යොමු කල යුතු වේ. එම වැඩසටහන සඳහා අදාල ප්‍රතිපාදන මෙම අමාත්‍යාංශයෙන් ඉන් අනතුරුව නිදහස් කෙර්.

4. ඔබේ දිස්ත්‍රික්කයට අදාල ගරු ජාතික ලැයිස්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත අයවැය ව්‍යාපෘති යෝජනා ද මෙම අමාත්‍යාංශයෙන් අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට හැකි වනු පිණිස දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතු වේ.

5. ඉදිකිරීම් ව්‍යාපෘතියක අවම වියදම් සීමාව රු 200,000/= කි. කරුණාකර හඳුනාගන්නා ඉදිකිරීම් ව්‍යාපෘතියක වටිනාකම අවම සීමාව වන රු 200,000 ක සහ උපරිම සීමාව රුපියල් මිලියන 5ත් අතර පවත්වා ගැනීම තහවුරු කර ගැනීමට කටයුතු කරන්න.

6. මීට ඉහත දී යොමු කරන ලද අංක MNPEA/01/2015 හා 2015.11.26 දිනැති චක්‍රලේඛයේ 4 වගන්තිය “ රජයේ සියළුම කොන්ත්‍රාත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ ප්‍රතිපාදනයන්ට අනුව ක්‍රියාත්මක කල යුතු වේ. එසේ වුවත්, ප්‍රජා මූලික සංවිධාන ඇතුළුව කිසිදු පාර්ශවයන් වෙත කිසිම අවස්ථාවක සෘජු කොන්ත්‍රාත් හෝ වරණයන් ලබා දීමට කිසි සේත් අවසර නොලැබේ ” ලෙස මෙයින් සංශෝධනය කරමි. මේ සම්බන්ධයෙන්, දිස්ත්‍රික්කය තුල කොන්ත්‍රාත් සිදු කිරීමට උවමනාව සහ හැකියාව ඇති ව්‍යවසායකයින් බලගැන්වීමට හා පුහුණු කිරීමට අවශ්‍ය පියවර ඔබ විසින් ගත යුතු වේ. තවද, ප්‍රාදේශීය ලේකම්වරුන් විසින්, විමධ්‍යගත අයවැය වැඩසටහන කඩිනම් කිරීම සඳහා මෙම වසරේ පළමු කාර්තුව තුලම කොන්ත්‍රාත් කරුවන් ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතු වේ.

7. මෙම විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියත්මක කිරීම අධීක්ෂණය සහ ප්‍රතිපල අත්කර ගැනීම තහවුරු කිරීම මෙම අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

එම්.අයි.එම්. රෆීක්

ලේකම්

පිටපත් -

1. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් - කා.දැ.ස.
2. ලේකම්, මුදල් අමාත්‍යාංශය - කා.දැ.ස.
3. ලේකම්, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස.
4. ලේකම්, මහනගර සහ බස්නාහිර පළාත් සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස හා අ.ක.ස
5. ලේකම්, නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ.ස හා අ.ක.ස
6. ලේකම්, අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස හා අ.ක.ස
7. ලේකම්, පුනුරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය - කා.දැ.ස හා අ.ක.ස
8. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කා.දැ.ස.
9. විගණකාධිපති - කා.දැ.ස.
10. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස හා අ.ක.ස
11. අධ්‍යක්ෂ ජනරාල් ,ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස හා අ.ක.ස
12. අධ්‍යක්ෂ ජනරාල් , ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - දැ.ගැ.ස හා අ.ක.ස
13. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරු - දැ.ගැ.ස හා අ.ක.ස
14. ප්‍රධාන ගණකාධිකාරී, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය - දැ.ගැ.ස හා අ.ක.ස